# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ද්විතීය පරීක්ෂණය (බාහිර) - 2011
2012 දෙසැම්බර් / 2013 ජනවාරි

සමාජීය විද්‍යා පීඨය

දර්ශනය - **PHIL - E 2025**

බටහිර දර්ශනය

**ප්‍රශ්න හතරකට (04) පිළිතුරු සපයන්න.**

ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි. කාලය : පැය 03 යි.

---

01. ''ආදී මානව විඥාණය පරිසරය හා ඒකාත්මිකව පරිණාමය වූවකි.'' මානව පරිණාමයේ අවධි අනුව මෙය වර්ධනය වූ ආකාරය සාකච්ඡා කරන්න.

02. ''ග්‍රීක චින්තනය එවකට පැවති දේශපාලන බල අධිකාරියට එරෙහිව බිහි වූවකි.'' සොක්‍රටීස් සිට ඇරිස්ටෝටල් දක්වා දිවෙන දාර්ශනික ධාරාව ඇසුරෙන් මෙම කියමනට පක්ෂව හෝ විපක්ෂව කරුණු දක්වන්න.

03. ''ප්ලේටෝගේ දේශපාලන දර්ශනය ''මනෝරාජික'' සංකල්පයක් ලෙස ඉවත දැමිය හැකිද? එවකට දේශපාලන හා සමාජ දර්ශනය ඇසුරෙන් උදාහරණ සහිතව විමසීමට ලක් කරන්න.

04. ස්ටෝයික් වාදය හා එපිකියුරියානු වාදය මගින් ගොඩ නගන ලද දාර්ශනික ප්‍රවාහය වත්මන් සමාජයට හා දේශපාලන දර්ශනයට කෙසේ අනුගත කළ හැකිද යන්න විචාරාත්මකව පහදන්න.

05. හෙරක්ලිටස්ගේ ''ප්‍රවාහී'' දහම බෞද්ධ දර්ශනය හා කොතෙක් දුරට ගැලපේදැයි සංසන්දනාත්මකව විග්‍රහ කරන්න.

06. කාන්ට්ගේ ඥාණ විභාගයත් හෙගල් ගේ ඥාණ විභාගයත් අතර දක්නට ලැබෙන සම අසමතා උදාහරණ සහිතව පහදන්න.

07. ''සාංදෘෂ්ටිකවාදී දර්ශනයේ මූලික හරය ''මිනිස් පැවැත්ම'' පිළිබඳ ගැටලුව අධ්‍යතන සමාජයට ප්‍රායෝගිකව ආදේශ කිරීමයි.'' මෙම කියමනට පක්ෂව හෝ විපක්ෂව කරුණු දක්වන්න.

08. ''භවසත්තවාදී'' සාහිත්‍යකරුවෙකු වූ ඇල්බෙයර් කැමූ ගේ ''මහාමාරිය'' (The Plaque) නවකථාව මගින් මිනිසාගේ ප්‍රකෘති තත්වය විද්‍යාමාන වන ආකාරය උදාහරණ සහිතව සාකච්ඡා කරන්න.

****************************